පාලන වක්‍රලේඛ අංක - 2024/03

මගේ අංකය : 2/1/145(IV)
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
අංක 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.



2024.07.24

ප්‍රධාන කාර්යාලයේ අංශභාර සියලුම අධ්‍යක්ෂවරුන් සහ
සියලුම කලාප කාර්යාල අධ්‍යක්ෂවරුන් වෙත,

ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1)අ, 22(1)ආ, 22(1)ආ ආ, 22(1)ඇ, 22(1)ඉ, 24(1), 27(අ), 42(ඌ)(1)(අ අ), 42(ඌ) වගන්ති යටතේ කොමිෂන් සභාව සතු ඉඩම් සඳහා විකුණුම්කර, බදු ගිවිසුම් සහ බලපත්‍ර නිකුත් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක Sec/2024/1 හා 2024.05.07 දිනැතිව යොමු කරන ලද ලිපියේ සඳහන් ලිපිගත උපදෙස් අනුව, ඉඩම් පවරාදීම විෂයෙහිලා මේ වන විට අනුගමනය කරන ක්‍රියාමාර්ග සංශෝධනය කරමින් නව වක්‍රලේඛයක් පිළියෙල කිරීම සඳහා 2024.05.08 වැනි දින පැවැත්වූ 806 වැනි කොමිෂන් සභා වාරයට ඉදිරිපත් කල 12703 ,12800 සහ 12827 දරණ කොමිෂන් පත්‍රිකා සඳහා ලබා දෙන ලද නිරණ ප්‍රකාරව සකස් කරන ලදී.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් බැහැරකිරීමේදී (විකිණීම/බදුදීම) 2024.07.24 දින සිට මෙම වක්‍රලේඛය බලපැවැත්විය යුතුය. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් විකිණීම සහ බදු දීම පහත සඳහන් කාණ්ඩ යටතේ පමණක් සිදු කළ යුතුය.

1. බලපත්‍ර, ඉඩම් කච්චේරි සහ සුදුසුකම් පරීක්ෂණ මඟින් තෝරාගෙන ඇති නේවාසික කාර්යයන් සහ භුක්තිය සඳහා යොදා ගෙන ඇති ඉඩම් විකිණීම.
2. අනවසරයෙන් ඇතුළුවී නේවාසික හෝ කෘෂිකාර්මික (කුඹුරු නොවන) කටයුතු සඳහා යොදාගෙන ඇති ඉඩම් විකිණීම.
3. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කුඹුරු ඉඩම් වලට අදාළ අඳ ගොවියන් වෙත ඉඩම් විකිණීම සහ බදු දීම.
4. නිවාස කාර්යයන් සඳහා නව ඉඩම් ලබා දීම.
5. පූජනීය ස්ථාන, පුණ්‍යාහාර, සමිති, පලාත් පාලන ආයතන, පොදු කටයුතු හා රාජ්‍ය ආයතන සඳහා ඉඩම් විකිණීම සහ බදුදීම
6. කොමිෂන් සභාව සතු ඉඩම් වල පිහිටි කඩකාමර පවරාදීම.
7. කෘෂිකාර්මික ව්‍යාපෘති / කෘෂිකාර්මික නොවන ව්‍යාපෘති සඳහා ඉඩම් බදු දීම.
8. ඛනිජ සම්පත් බදුදීම.

ඉහත කාණ්ඩ යටතේ ඉඩම් පවරා දීමේදී පහත සඳහන් ක්‍රමවේද අනුව කටයුතු සිදු කළ යුතුය.

A. විකිණීමෙන් පවරාදීමේ ක්‍රමවේදය

1. බලපත්‍ර, ඉඩම් කච්චේරි සහ සුදුසුකම් පරීක්ෂණ මඟින් තෝරාගෙන ඇති නේවාසික කාර්යයන් සහ භුක්තිය සඳහා යොදා ගෙන ඇති ඉඩම් විකිණීම

(1.අ.) 2014.12.31 දින දක්වා ඉඩම් පවරාදීමේදී/ විකිණීමේදී, ඉඩමේ පදිංචියට/ භුක්තියට පැමිණි දිනට රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව පදනම් කරගෙන පහත සඳහන් පරිදි විකිණීමට කටයුතු කළ යුතුය.

නීතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

ඉඩම් කව්චේරි/ සුදුසුකම් පරීක්ෂණ සහ බලපත්‍රලාභීන්	නියමානුකූල කරනු ලබන කාල වකවානුව	නියමානුකූල කල හැකි ප්‍රමාණය
	2014.12.31 දින දක්වා	උපරිමය අක්කර 02 රූඩ් 1 වන සේ බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය

(1.ආ.) 2014.12.31 දින දක්වා ඉඩම් පවරාදීමේදී/ විකිණීමේදී බලපත්‍රයේ සඳහන් උපරිමය ඉක්මවා පවතින බිම් ප්‍රමාණය, අදාල පළාත් පාලන ආයතනයේ සැලසුම් අනුමැතිය ලබා ගැනීම සඳහා සැලකිය යුතු අවම බිම් ප්‍රමාණයට අඩු වන්නේ නම්, එම බිම් ප්‍රමාණයද භුක්තියට / පදිංචියට පැමිණි වර්ෂයේ නොදියුණු වෙළඳපොළ වටිනාකම මත විකිණීමෙන් පවරාදීම සිදු කළ යුතුය. එසේ නොමැති විට හා උපරිමය ඉක්මවන අවස්ථාවේදී උපරිමය ඉක්මවන බිම් ප්‍රමාණය වර්තමාන නොදියුණු තක්සේරු වටිනාකම මත බදු දීමෙන් පවරා දීමට හැකි අතර එසේ නැතහොත් කොමිෂන් සභාවට එම උපරිමය ඉක්මවන ඉඩම් ප්‍රමාණය පවරා ගත යුතුය.

(1.ඇ.) කොමිෂන් සභාවට පවරා ගනු ලබන බිම් ප්‍රමාණය කොමිෂන් සභාවේ පවතින බදු ප්‍රතිපත්තිය මත බදු දීම.

2. අනවසරයෙන් ඇතුළුවී නේවාසික හෝ කෘෂිකාර්මික (කුඹුරු නොවන) කටයුතු සඳහා යොදාගෙන ඇති ඉඩම් විකිණීම සහ බදු දීම.

(2.අ.) 2014.12.31 දින දක්වා ඉඩම් පවරාදීමේ දී ඉඩමේ පදිංචියට/ භුක්තියට පැමිණි දිනට රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව පදනම් කරගෙන පහත සඳහන් පරිදි විකිණීමෙන් පවරාදීමට කටයුතු කළ යුතුය.

අනවසර	නියමානුකූල කරනු ලබන කාල වකවානුව	නියමානුකූල කල හැකි උපරිම ප්‍රමාණය
	2001.10.10 දින දක්වා	රූඩ් 02
	2001.10.11 දින සිට 2014.12.31 දින දක්වා	පර්චස් 20 පළාත් පාලන ආයතන වල අනුබෙදුම් සීමාවට යටත්ව

(2.ආ.) 2014.12.31 දින දක්වා ඉඩම් පවරාදීමේදී/ විකිණීමේදී උපරිමය ඉක්මවා පවතින බිම් ප්‍රමාණය, අදාල පළාත් පාලන ආයතනයේ සැලසුම් අනුමැතිය ලබාගැනීම සඳහා සැලකිය යුතු අවම බිම් ප්‍රමාණයට අඩු වන්නේ නම්, එම ප්‍රමාණයද භුක්තිය/ පදිංචිය නහවුරු කරන වර්ෂයේ රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ භුක්තිය නහවුරු කරන වර්ෂයේ නොදියුණු තක්සේරු වටිනාකම මත පවරා දිය යුතුය.

(2.ඇ.) ඉහත 2.(අ) සහ 2.(ආ) හී සඳහන් ප්‍රමාණයන්ට හා කාලසීමාවන්ට අදාලව අවම අනුබෙදුම් බිම් ප්‍රමාණය ඉක්මවා උපරිමයට වැඩිපුර පවතින හා සංවර්ධනය කොට භුක්ති විඳිනු ලබන ඉඩම් ප්‍රමාණයන් රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ වර්තමාන තක්සේරුව මත පදනම්ව බදු පදනම යටතේ ලබා දිය යුතුය.

(2.ඈ.) ඉහත (2.ආ.) හා (2.ඇ.) හි සඳහන් ආකාරයට ලබා ගැනීමට එකඟ නොවන අවස්ථාවේදී එම බිම් ප්‍රමාණය කොමිෂන් සභාවට පවරා ගත යුතුය.

(2.ඉ.) 2015.01.01 දිනෙන් පසු කොමිෂන් සභාව සතු ඉඩම්වලට අනවසරයෙන් ඇතුළුවී ඇති සියලුම අනවසරකරුවන් නෙරපීමට, රජයේ ඉඩම් සන්තකය නැවත පවරාගැනීමේ පනතේ විධිවිධාන අනුව කටයුතු සිදුකර අනවසරකරුවන් ඉවත් කළ යුතුය. ඊට අදාළ වගකීම් ඉටු නොකරනු ලබන දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලයේ කලාප සහකාර අධ්‍යක්ෂවරුන් ඇතුළු වගකිවයුතු සියලු නිලධාරීන් සම්බන්ධව විනයානුකූල පියවර ගත යුතුය.

නිතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

3. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කුඹුරු ඉඩම් වලට අදාළ අඳ ගොවියන් වෙත ඉඩම් විකිණීම සහ බදු දීම.

(3.අ.) 2010.12.31 දින දක්වා කෘෂිකාර්මික කාර්යයන් සඳහා කුඹුරු ඉඩම් පවරාදීමේ දී ඉඩමේ අඳ ගොවිභාවය තහවුරු කරන දිනට රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව පදනම් කරගෙන අක්කර 02 කට අඩු ඉඩම් විකිණීමෙන් පවරාදීමට කටයුතු කළ යුතු අතර එම දිනට අක්කර 02 ඉක්මවන බිම් ප්‍රමාණය රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත භුක්තිය තහවුරු කරන වර්ෂයේ නොදියුණු තක්සේරුව පදනම් කරගෙන බදු පදනම මත ලබා දිය යුතුය.

(3.ආ.) 2011.01.01 දින සිට වර්තමානය දක්වා කෘෂිකාර්මික කාර්යයන් සඳහා කුඹුරු ඉඩම් පවරාදීමේ දී ඉඩමේ අඳ ගොවිභාවය තහවුරු කරන දිනට රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව පදනම් කරගෙන ඉඩම් ප්‍රමාණයන් වාර්ෂික බදු පදනම මත ලබා දිය යුතුය. මෙම කාල සීමාවට අයත් කුඹුරු ඉඩම් සඳහා බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කෙරේ.

4. නිවාස කාර්යයන් සඳහා නව ඉඩම් ලබා දීම.

නව ඉඩම් බෙදා දීමේදී ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතන යන ආයතන වල අවස්ථානුකූලව නිර්දේශ ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර එකී නිර්දේශයන්ට අනුගතව නේවාසික භාවිතාවන් සඳහා බැහැර කළ යුතු ඉඩම් හඳුනා ගැනීමෙන් පසු සුදුසුකම් පරීක්ෂණයකට යටත්ව කට්ටිකරුවන් තෝරා ගත යුතුය.

I. පවුල් ඒකකයක් සඳහා නව ඉඩම් ලබා දීමේදී පවරා දෙනු ලබන බිම් ප්‍රමාණය අදාළ පලාත් පාලන අයතනයේ අනුමත අවම අනු බෙදුම් සීමාවට සහ උපරිම පර්චස් 20ක ප්‍රමාණයකට යටත්ව කොමිෂන් සභාව තීරණය කරනු ලබන ප්‍රමාණය රජයේ වර්තමාන තක්සේරුවට යටත්ව විකිණීමෙන් පවරා දීමට කටයුතු කළ යුතුය.

II. ඉඩමේ භුක්තිය භාරදෙනු ලබන වර්ෂයේ රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වටිනාකම, මැනුම් ගාස්තු, මුද්දර ගාස්තු, නීතිඥ ගාස්තු, රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු ගාස්තු, සේවා ගාස්තු, ව්‍යවස්ථාපිත බදු සහ කොමිෂන් සභාවට අයවිය යුතු අනෙකුත් ගාස්තුවක් වේ නම්, එකී ගාස්තු අයකර ගත යුතුය.

5. පූජනීය ස්ථාන, පුණ්‍යභාර, සමිති, පළාත් පාලන ආයතන, පොදු කටයුතු සහ රාජ්‍ය ආයතන සඳහා ඉඩම් ලබාදීම

(5.අ.) පූජනීය ස්ථාන සඳහා ඔප්පු ලබාදීම.

(5.අ.1) 2021.01.01 දින වන විට පූජනීය ස්ථානයක් පවත්වාගෙන යනු ලබන බිම් කොටස්, භුක්තිය තහවුරු කරන වර්ෂයේ රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වටිනාකමින් 25% ක වටිනාකමක් අයකර අක්කර 02ක උපරිමයකට යටත්ව විකුණුම්කරයක් මඟින් විහාරස්ථ දායක සභාව, දේව සභාව, මීසම, භාරකාර මණ්ඩලය, කෝවිල් කමිටුව හෝ අදාල එම ආයතනයේ අධිකාරීත්වය දරණ තනතුරෙහි නමින් විකුණුම්කරයක් මඟින් නියමානුකූල කළ යුතුය.

I. ඉහත (5.අ.1) සඳහන් ප්‍රමාණය ඉක්මවා භුක්ති විඳිනු ලබන ප්‍රමාණය පහත සඳහන් පරිදි බදු පදනම මත ලබා දිය යුතුය.

a. ආගමික සහ කෘෂිකාර්මික කටයුතු සඳහා වාර්ෂික තක්සේරු මුදලින් 4% ක වාර්ෂික බද්දක් අය කිරීම.

b. ආගමික සහ කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා වාර්ෂික තක්සේරු මුදලින් 6% ක වාර්ෂික බදු මුදලක් අය කිරීම.

නීතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

(5.ආ.) පුණ්‍යභාර ඇතුළු ලාභ අරමුණු කර නොගත් රාජයේ ලියාපදිංචිගත ආයතන සඳහා ඉඩම් ලබාදීම.

I. ඉහත (5.ආ.) ට ඇතුලත් වන රජයේ ලියාපදිංචිගත සංවිධානයන්හි ඉල්ලීම් සලකා බලා අදාළ කාර්යය වෙනුවෙන් ඉඩම යොදා ගැනීම ආරම්භ කළ බව තහවුරු කරන වර්ෂයට අදාළ රජයේ තක්සේරු වටිනාකම් මත උපරිම පර්චස් 80ක් දක්වා විකිණීමෙන් පවරා දිය යුතුය.

II. පර්චස් 80ක් ඉක්මවන්නේ නම් සම්පූර්ණ ඉඩම් ප්‍රමාණයම බදු පදනම් මත ලබා දීමට කටයුතු කළ යුතුය. තවද, භුක්තියට පැමිණි වර්ෂයේ සිට වර්තමානය දක්වා පරිහරණ මුදලක් අය කල යුතු අතර රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ වර්තමාන වර්ෂයේ නොදියුණු වෙළඳ වටිනාකම් මත තක්සේරු මුදලින් වාර්ෂිකව 4% ක් අයකර බදු පදනම් මත ලබා දිය යුතුය.

III. මෙම අරමුණු සඳහා වර්තමානයේ ලැබෙන නව ඉල්ලීම් වලට අදාළව කටයුතු සිදු කිරීමේදී උපරිම පර්චස් 40ක ප්‍රමාණයකට යටත්ව ප්‍රධාන තක්සේරුකරුගේ වර්තමාන වෙළඳපොල වටිනාකම් මත තක්සේරු මුදලින් වාර්ෂිකව 4% ක් අයකර බදු පදනම් මත ලබා දිය යුතුය.

(5.ඇ.) පළාත් පාලන ආයතන සඳහා ඉඩම් ලබාදීම.

I. පළාත් පාලන ආයතන විසින් පවත්වාගෙන යනු ලබන ග්‍රාමීය ක්‍රීඩාපිටි, සුසානභූමි,ආදාහනාගාර,සහ පොදු වැසිකිළි යන ආදිය භුක්තිය තහවුරු කරන වර්ෂයේ රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ නොදියුණු තක්සේරු වටිනාකමින් 25% ක මුදලක් අයකර විකිණීමෙන් පවරාදීමට හෝ එම ආයතනයේ කැමැත්ත පරිදි බදු පදනම් මත තක්සේරු වටිනාකමින් 2% වාර්ෂික බදු මුදලක් අයකර බදු පදනම් මත ලබාදීම.

II. පළාත් පාලන ආයතන මඟින් ආදායම් ඉපයීමේ අරමුණින් පවත්වාගෙන යනු ලබන පෙරපාසැල්, සතිපොළ, රථවාහන ගාල්, උයන්වතු හා ක්‍රීඩාපිටි ඇතුළු (ඉහත I මඟින් ආවරණය නොවන) සියලුම ඉඩම් සහ දේපල භුක්තියට පැමිණි වර්ෂයේ රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2% ක වාර්ෂික බදු මුදලක් අයකර බදු පදනම් මත ලබා දිය යුතුය.

III. පළාත් පාලන ආයතන මඟින් පවත්වාගෙන යනු ලබන කඩ කාමර රජයේ ප්‍රධාන තක්සේරුගේ භුක්තියට පැමිණි වර්ෂයේ තක්සේරුව මත 4% ක වාර්ෂික බදු මුදලක් යටතේ බදු පදනම් මත ලබාදීම.

IV. 1973 අංක:37 දරන ජාතික මංමාවත් පනතේ (522 පරිච්ඡේදයේ) නිර්වචනය කර ඇති පරිදි මාර්ග ඉදි කිරීම සඳහා පළාත් පාලන ආයතනයට හෝ ප්‍රවේශ මාර්ගයේ අයිතිය ඇති අදාළ ආයතනය විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් ඉල්ලීම් කර ඇති නම් ඉඩම් පවරාදීම ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධිත) පනතේ 22(1)ඉ සහ හෝ 42 ඌ (1) ඉ වගන්තිය යටතේ පවරා දීම සිදුකළ යුතුය.මේ යටතේ කොමිෂන් සභාව විසින් දැනටමත් බැහැර කර ඇති සහ ඉදිරියේදී පවරාදීමට නියමිත ඉඩම් කට්ටි වලට අදාළ වන්නා වූ ප්‍රවේශ මාර්ග ගාස්තු අය කිරීමකින් තොරව අදාළ පළාත් පාලන ආයතන වලට පවරා දිය යුතුය. කෙසේ වුවද කොමිෂන් සභාව සතු ඉඩමක් පොදු මාර්ගයක් ලෙස භාවිතා කිරීම සඳහා ඉල්ලීමක් ලද විට ඉහත ක්‍රමවේදය අනුගමනය කළ යුතුය.

(5.ඈ.) සඟස සමිති, සමුපකාර සමිති, සුභසාධක සමිති,ක්‍රීඩා සමිතිය ඇතුළු රජයේ ලියාපදිංචි සමිති සඳහා උපරිමය අක්කර 01ක ප්‍රමාණයක් භුක්තියට පැමිණි වර්ෂයේ රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ නොදියුණු තක්සේරු වටිනාකම් අයකර සහ භුක්තියට පැමිණි වර්ෂයේ සිට විකිණීමෙන් පවරා දෙනු ලබන වර්ෂය දක්වා තක්සේරුවෙන් 10% ක වාර්ෂික පරිහරණ ගාස්තුවක් අයකිරීමෙන් විකිණීමෙන් පවරා දීම. උපරිමය අක්කර 01 ට වැඩි ප්‍රමාණය බදු දීමෙන් පවරාදීම හෝ කොමිෂන් සභාවට ඉදිරිපත් කර එකී තීරණ අනුව කටයුතු කළ යුතුය.

නීතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

(5.ඉ.) රාජ්‍ය සංස්ථා, ව්‍යාවස්ථාපිත මණ්ඩල සඳහා භුක්තිය තහවුරු කරනු ලබන වර්ෂයේ ප්‍රධාන තක්සේරුකරුගේ නොදියුණු තක්සේරුව සහ එසේ පවරා දීමේදී භුක්තියට පැමිණි වර්ෂයේ සිට විකිණීමෙන් පවරා දෙනු ලබන වර්ෂය දක්වා තක්සේරුවෙන් 10% ක වාර්ෂික පරිහරණ ගාස්තුවක් අයකිරීමෙන් විකිණීමෙන් පවරා දීම හෝ බදු පදනම මත පවරාදීම.

6. කොමිෂන් සභාව සතු ඉඩම් වල පිහිටි කඩකාමර පවරාදීම.

(6.අ.) කොමිෂන් සභාව සතු ඉඩම් වල පවත්වාගෙන යනු ලබන කඩකාමර විකිණීමෙන් පවරාදීමේදී රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ වර්තමාන නොදියුණු වෙළඳ වටිනාකම මත විකිණීමෙන් පවරාදීම හෝ බදු පදනම යටතේ ලබාදීම.

ඉඩම් පැවරීම් නියෝග

01. මෙම නියෝග ඉඩම් පැවරීම් නියෝග යනුවෙන් හැඳින්වෙන අතර ඉහත වක්‍රලේඛයේ සඳහන් කාණ්ඩයන් සහ ඊට අදාළ වගන්ති මෙම නියෝගයන් අනුව ක්‍රියාත්මක කළ යුතුය.

02. මෙම වක්‍රලේඛයේ දිනට ප්‍රථම ඉඩම් පවරාදීම සම්බන්ධව නිකුත් කර ඇති සියලුම වක්‍රලේඛ මෙමඟින් අවලංගු වන අතර, ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1)අ, 22(1)ආ, 22(1)ඇ, 22(1)ඉ, 22(1)ආ ආ, 24(1), 27(අ), 42(ඌ)(1)(අ අ) සහ 42(ඌ) වගන්ති යටතේ සිදුකරනු ලබන සියලු ඉඩම් පැවරීම් මෙම පැවරුම් නියෝග වලට යටත්ව සිදුකළ යුතුය.

03. (i) පූර්ව වක්‍රලේඛ හෝ කොමිෂන් තිරණ පරිදි යම් පුද්ගලයෙකු/ ඉල්ලුම්කරුවෙකු විසින් කොමිෂන් සභාව වෙත මෙම වක්‍රලේඛ දිනයට ප්‍රථම සම්පූර්ණ තක්සේරු වටිනාකම/ තක්සේරු වටිනාකමින් කොටසක් / තක්සේරු අත්තිකාරමක් ගෙවා ඇති විට එම අවස්ථාවේදී පැවති වක්‍රලේඛ පරිදි ක්‍රියා කළ යුතුය.

(ii) මෙම වක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනට පෙර නිකුත් කර ඇති මැනුම් නියෝග හා අනුමත පිඹුරුපත් වල සඳහන් කැබලි නියමානුකූල කිරීමේදී ඉඩමේ තක්සේරු වටිනාකම අයකිරීම පමණක් මෙම වක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.

(iii) ඉහත නියෝග අංක 02 අනුව කටයුතු කිරීමේදී පැවරීම් නියෝග 3(i) සහ 3(ii) ට අදාලව පෙර පැවති වක්‍රලේඛයේ ආවරණය නොවන කරුණක් සම්බන්ධයෙන් මෙම වක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.

04. 2015.01.01 දිනට පෙර නිවාස අරමුණු සඳහා විකිණීමෙන් පවරා දිය හැකි බිම් ප්‍රමාණයේ උපරිමය ඉක්මවන අවස්ථාවලදී එසේ උපරිමය ඉක්මවන බිම් ප්‍රමාණය අදාල පළාත් පාලන ආයතනයේ අවම බෙදුම් සීමාවට වඩා අඩු වන්නේ නම්, එම ප්‍රමාණයද රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ භුක්තිය තහවුරු කරන වර්ෂයේ නොදියුණු තක්සේරු වටිනාකම මත පවරා දිය හැකිය. අවම බෙදුම් සීමාව හෝ එය ඉක්මවන්නේ නම්, එය වෙනම බිම් කොටසක් ලෙස මැනුම් කළ යුතු අතර එම ප්‍රමාණය වර්තමාන රජයේ තක්සේරු වටිනාකමට හෝ බදු පදනම මත ලබාදිය යුතුය.

05. වාණිජ අරමුණු සඳහා භාවිත කළ හැකි සහ දැනටමත් වානිජ කටයුතු සඳහා භාවිතා කරන ඉඩම් නේවාසික කටයුතු වෙනුවෙන් පවරාදීමට කටයුතු නොකළ යුතු අතර බදු පදනම මත ලබා දිය යුතුය.

06. වක්‍රලේඛයේ 01 සහ 02 කාණ්ඩයන් යටතේ කටයුතු කිරීමේදී නේවාසික හෝ කෘෂිකාර්මික කාර්යය සඳහා ඇතුළු වූ බවට තහවුරු කරගැනීමේ ලේඛනය වශයෙන් මූලික තොරතුරු පත්‍රිකාව **(BIF)** සම්පූර්ණ කර එහි ඇතුලත්ව ඇති පහත නම් සඳහන් නිලධාරීන් 04 දෙනාගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය.

නිතිඳ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

- ක්ෂේත්‍ර නිලධාරී
- දිස්ත්‍රික් අධ්‍යක්ෂ
- ග්‍රාම නිලධාරී
- ප්‍රාදේශීය ලේකම්

07. පහත පරිදි විකිණීමෙන් හෝ බදු දෙනු ලබන සියළු ඉඩම් පවරාදීම් සඳහා එම ඉඩමේ පදිංචියට/ භුක්තියට පැමිණි වර්ෂයේ සිට වර්තමානය දක්වා අනවසර පරිහරණ ගාස්තු අය කළ යුතුය.

I. ඉහත වක්‍රලේඛයේ ඉඩම් කව්වේරි සහ සුදුසුකම් පරීක්ෂණ මඟින් තෝරාගෙන ඇති සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් භුක්තිය භාරදී ඇති ඉඩම්ලාභීන් වෙතින් ඉඩම් පරිහරණ ගාස්තු අයකළ යුතු අතර එය වසරකට පර්:01 ක් සඳහා රු:10.00 බැගින්ද,

II. අනවසරකරුවන් නියමානුකූල කිරීමේදි අනවසර පරිහරණ ගාස්තු අයකළ යුතු අතර එය වසරකට පර්චස් 01ක් සඳහා රු :15.00 බැගින්ද,

III. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල වෙත ඉඩම් විකිණීමෙන් බැහැර කිරීමේදී භුක්තියට පැමිණි වර්ෂයේ රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එදින සිට භුක්ති විඳිම වෙනුවෙන් වාර්ෂිකව 10% ක අවම මුදලක් පවරා දෙනු ලබන දිනය දක්වා අය කළ යුතුය.

IV. කොමිෂන් සභාව සතු කඩකාමරයක් සඳහා වසරකට රු:2000ක් බැගින් අනවසර පරිහරණ ගාස්තුවක්ද,

V. කුඹුරු ඉඩම් සඳහා ගොවිතැන් කරන ලද වගා කන්නයක් සඳහා අක්කරයකට රු:1000.00 ක් බැගින් වන ප්‍රවේණි මුදලක්ද අය කළ යුතුය,

08. වක්‍රලේඛයේ සඳහන් ඉඩම් කව්වේරි සහ සුදුසුකම් පරීක්ෂණ මඟින් තෝරාගෙන ඇති එකම පවුලේ බිරිඳ සහ ස්වාමියා යන දෙදෙනාටම බලපත්‍ර සහිතව නේවාසික හෝ කෘෂිකාර්මික කාර්යය සඳහා ඇතුළු වූ බව තහවුරු කරනු ලබන විට එක් අයෙකු සඳහා එක් කොටසක් බලපත්‍රලාභී පදනම මත පදිංචිය/භුක්තිය තහවුරු කරන වසරේ උපරිම ප්‍රමාණයට යටත්ව නියමානුකූල කිරීමද ඉතිරි ඉඩම් ප්‍රමාණයෙහි භුක්තිය/පදිංචිය තහවුරු කරනු ලබන වර්ෂයේ සිට වර්තමානය දක්වා පරිහරණ මුදල් අයකර බදු පදනම යටතේ හෝ වක්‍රලේඛයේ දැක්වෙන උපරිමයට යටත්ව වර්තමාන තක්සේරුව යටතේ විකිණීමෙන් පවරා දිය යුතුය.

09. එක් පවුල් ඒකකයකට හිමිවිය යුතු ඉඩම් ප්‍රමාණය තීරණය කිරීමේදී කැබලි කිහිපයක් තනි ඒකකයක් ලෙස සැලකිය යුතු අවස්ථා

I. එක් පවුල් ඒකකයක් සඳහා උපරිම ඉඩම් ප්‍රමාණයක් තීරණය කිරීමේදී යම් ඉඩමක් ස්වාභාවික නොවන හේතුවක් මත ඉඩම් කැබලි කිහිපයකට වෙන්වී ඇති නම් (උදා:-මාර්ගයක්,කාණුවක් ඉදිකිරීම) එම ඉඩම් උපරිම ප්‍රමාණයක් තීරණය කිරීමේදී මෙම වක්‍රලේඛය අනුව එකම ඉඩමක් ලෙස සැලකිය යුතුය.

II. එක් පවුල් ඒකකයක් සඳහා එකට යා වූ ඉඩම් කැබලි කිහිපයක් පවතීනම් එම ඉඩම් කොටස්වල සංවර්ධන තත්ත්වය සළකා (නිවස කැබලි කිහිපයකට හසුවන සේ ඉදි කර තිබීම, ලිඳ, වැසිකිලිය සහ ප්‍රධාන ගොඩනැගිල්ලට අත්‍යවශ්‍ය අංගයන්) වක්‍රලේඛ ප්‍රකාරව උපරිමයට යටත්ව බැහැර කිරීම.

III. ස්වභාවික නොවන කාරණාවක් මත ඉඩම් කැබලි කිහිපයක් වෙන් වෙන්ව පිහිටා ඇති විට පිඹුරේ නම් සඳහන් අය පදිංචිව සිටින කොටස උපරිමයට යටත්ව විකිණීමෙන් පවරා දීමටත් ඉතිරි කොටස් බදු පදනම මත ලබා දීමටත් කටයුතු කළ යුතුය.

IV. ස්වභාවික නොවන කාරණාවක් මත ඉඩම් කැබලි කිහිපයක් වෙන් වෙන්ව පිහිටා ඇති විට සහ එම ඉඩම් කොටස් වල දරුවන් පදිංචිව සිටී නම් උපරිමයට යටත්ව දරුවන් නමින් නියමානුකූල කිරීමට.

V. චරින් වර නිකුත් කර ඇති වක්‍රලේඛන හා නියෝග ප්‍රකාරව ඉඩම් කුඩා කොටස්වලට වෙන් කර මැනුම් නියෝග නිකුත් කර ඇති අවස්ථාවන්හිදී දිස්ත්‍රික් අධ්‍යක්ෂකගේ ලිඛිත නිර්දේශයක්

නීතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

සහිතව මූලික තොරතුරු පත්‍රිකාව (BIF) මඟින් අධ්‍යක්ෂ ඉඩම් වෙත වාර්තා කළ යුතු අතර, එහිදී අධ්‍යක්ෂ ඉඩම් විසින් සිත්නක්කරව බැහැර කල හැකි ඉඩම් ප්‍රමාණය මෙම වක්‍රලේඛයේ දක්වා ඇති සීමාවන්ට යටත්ව සලකා බැලිය යුතුය.

VI. ස්වභාවික හේතූන් මත ඉඩම් කොටස් වෙන්ව ඇති අවස්ථාවකදී පලාත් පාලන ආයතනයේ අනු බෙදුම් සීමාවට අඩුවන කොටස් වක්‍රලේඛයේ උපරිම සීමාවට අනුකූලව බැහැර කිරීම.

10. පහත අවස්ථාවන් විශේෂ අවස්ථා ලෙස සලකා එකී සුදුසුකම් සපුරන පුද්ගලයින් සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය මත නේවාසික කාර්යයන් සඳහා ඉඩම් පවරාදීමේ දී ඒම ඉඩමේ පදිංචිව සිටී නම් පදිංචියට පැමිණි දිනට රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවෙන් 10% ක ප්‍රතිශතයක් අය කරගෙන විකිණීමෙන් පවරාදීම සහ නව ඉඩම් ලබා දීමක් වන්නේ නම් ඉඩම ලබා දුන් වර්ෂයේ රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවෙන් 10%ක් අය කළ යුතුය.

a. බිරිඳ, සැමියා හෝ දරුවන් පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වීම මත පවුල් සංස්ථාව අකර්මණ්‍ය වීම. (ස්ථීර ආදායමක් උපයාගත නොහැකි.)

b. බාල වයස්කරුවන් සහිත පවුලක කලත්‍රයා මිය යෑම හේතුවෙන් පවුලේ ආදායම අහිමි වීම.

c. දරුණු රෝගාබාධ සඳහා (රජයේ වක්‍රලේඛණය මඟින් රෝග සඳහා ආධාර ලබා දෙන රෙගුලාසි අනුව)

d. රජය විසින් අඩු ආදායම්ලාභීන් ලෙස හඳුනාගෙන ඇති විශේෂ ප්‍රතිලාභ (උදා:- අස්වැසුම) ලබන පුද්ගලයින්

- **ඉහත විශේෂ අවස්ථා සඳහා සුදුසුකම් ලබන්නා වූ ප්‍රතිලාභීන් පහත සඳහන් නිර්නායකයක් යටතේ සළකා බැලිය යුතුය.**

  - ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ
  - ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිර්දේශ
  - සමාජ සේවා දෙපාර්තමේන්තු නිර්දේශ
  - ආරක්ෂක අමාත්‍යාංශයේ නිර්දේශ
  - වෛද්‍ය සහතික සහ රෝග නිශ්චයන් පිළිබඳ නිර්දේශ

11. මෙම වක්‍රලේඛයේ කාණ්ඩ අංක 1 සහ කාණ්ඩ අංක 2 යන වගන්තීන් යටතේ ඉඩමක් ඉල්ලුම් කිරීමේදී ඉල්ලුම්කරුට සහ හෝ පිඹුරේ නම් සඳහන් කට්ටිකරුට අදාල කාරණා පමණක් සලකා බැලිය යුතුය. එසේ වුවද අදාළ ඉඩම් කොටසේ මුල් පදිංචිය/හුක්තිය පියා හෝ මව හෝ එකම පවුලේ සහෝදරයා හෝ සහෝදරිය යම් කාලයක් පදිංචිය/හුක්තිය දරනු ලැබුවේ නම් අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්කරුගේ ඉඩමේ හුක්ති විඳි කාලය සැලකිල්ලට ගැනීමේදී එකී ඥාතීත්වය මත පදනම්ව එක් එක් තැනැත්තාගේ හුක්තිය හෝ පදිංචි කාලය BIF අංක 05 යටතේ දැක්වෙන ලිඛිත සාක්ෂි අනුව අයදුම්කරුගේ වයෝපූර්ණත්වයට යටත්ව අදාල කර ගත යුතුය. මෙහිදී කාණ්ඩ අංක 01 යටතේ මව හෝ පියාගේ උරුමය මත, දරුවෙකුට හිමි විය යුතු බිම් ප්‍රමාණය හිමිකර දීමේදී, එසේ පවරා දිය යුතු බිම් ප්‍රමාණය මෙම වක්‍රලේඛයේ පවුල් ඒකකයකට පවරාදිය හැකි උපරිම සීමාවට යටත්ව සලකා බැලිය යුතුය.

12. තවද, ඒ.එල් අයදුම්පත්‍රයේ සහ පිඹුරේ නම සඳහන් අය කලත්‍රයෙක් වන අවස්ථාවක වර්තමානයේ අදාල ඉඩම් කොටසේ පදිංචිය හෝ හුක්තිය හැර ගොස් ඇත්නම්, එවැනි අවස්ථාවක පහත නම් සඳහන් අය සඳහා පිලිවෙලින් ඒ.එල් අයදුම්පතක් ඉදිරිපත් කිරීමේ හැකියාව පවතී.

- සැමියා/ බිරිඳ
- දරුවන්
- පියා/ මව
- එකම පවුලේ සහෝදර සහෝදරියන්

නීතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
අංක. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

13. මුල් පදිංචිකරු/භුක්තිකරු මියගොස් ඇති අවස්ථාවක පහත පරිදි කටයුතු කළ යුතුය.

i. මුල් පදිංචිකරු මියගොස් ඇති අවස්ථාවක විෂයගත ඉඩම් කොටසේ ඉහත පැවරුම් නියෝග 12 අනුව කාලත්‍රයා හෝ ඥාතින් ස්ථිර පදිංචිව සිටී නම් එකී පදිංචිකරු වෙත වක්‍රලේඛයේ උපරිම සීමාවට යටත්ව බැහැර කිරීම.

ii. මුල් භුක්තිකරු මියගොස් ඇති අවස්ථාවක විෂයගත ඉඩම් කොටසේ ඉහත පැවරුම් නියෝග 12 අනුව කාලත්‍රයා හෝ ඥාතින් භුක්තියේ සිටී නම් එකී භුක්තිකරු වෙත වක්‍රලේඛයේ කාණ්ඩ අංක 01 සහ කාණ්ඩ අංක 02 ප්‍රකාරව කටයුතු කිරීම හෝ

පොදු නීති යටතේ සියලුම උරුමකරුවන් දේපළ පැවරීම සම්බන්ධයෙන් එකඟතාවයක් දක්වන්නේ නම් දැනට මිය ගොස් සිටින මුල් පදිංචිකරු / භුක්තිකරුගේ පවුලේ සාමාජිකයකුට පවරා දීම කළ හැකිය.

14. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් මැනුම් කර ඇති ඉඩම් වල සිටින කට්ටිකරුවන් විසින් අදාළ ඉඩම් කොටස් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අවසරයකින් තොරව නීති විරෝධීව වෙනත් පාර්ශවයක් වෙත බැහැර කර ඇති අවස්ථාවන්හිදී අදාළ මිලදී ගත් පුද්ගලයන්ට එකී බිම් කොටස් වක්‍රලේඛයේ කාණ්ඩ අංක 02 අනුව නියමානුකූල කළ යුතුය.

තවද කොමිෂන් සභාවේ අනුමත පිඹුරක සඳහන් බිම් කොටසක 2014.12.31 දිනෙන් පසු පදිංචිව සිටින තැනැත්තෙකු නියමානුකූල කිරීමේදී පිඹුරෙහි නම සඳහන් පුද්ගලයා හෝ එම තැනැත්තා පසු ගැනුම්කරුවෙකුවන අවස්ථාවකදී මූලික තොරතුරු පත්‍රිකාවේ අංක 05 යටතේ සඳහන් ලේඛනයක් ආශ්‍රයෙන් පදිංචිය තහවුරු කළ යුතු අතර එම වර්ෂයේ රජයේ තක්සේරු වටිනාකම මත විකිණිමෙන් පවරා දිය යුතුය. (ඉහත නේවාසික කාර්යයට යොදාගත් ඉඩම් කොටසේ ප්‍රමාණය පර්:20 ඉක්මවන්නේ නම් එම වැඩිපුර ඉඩම් ප්‍රමාණය ඉඩමේ වගාවන් හා සංවර්ධනයන් ඇතුළු විස්තර සලකා බලාපවරා දීමට හෝ නොදීමට අදාල සාධනීය හේතු සහිත දිස්ත්‍රික් අධ්‍යක්ෂ සහ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ නිර්දේශ සහිත වාර්තාව (මූලික තොරතුරු පත්‍රිකාව BIF මඟින්) අධ්‍යක්ෂ ඉඩම් මඟින් කොමිෂන් සභාවට ඉදිරිපත් කර තීරණයක් ගැනීමට කටයුතු කළ යුතුය. නේවාසික නොවන කටයුත්තක් සඳහා යොදාගනු ලබන්නේ නම් සම්පූර්ණ ඉඩම් ප්‍රමාණයම බදු පදනම මත පවරා දිය යුතුය.)

15. ඉහත වක්‍රලේඛයේ 01 සහ 02 කාණ්ඩයන්ට ඇතුළත් වන කිසිදු ඉඩමක් සාධාරණ හේතුවක් නොමැතිව වසර 3 කට වඩා නේවාසික කාර්යයන් වෙනුවෙන්ද, කෘෂිකාර්මික කාර්යයක් සඳහා වසර 01 ක කාලයක් තුලදී ද අදාල භාවිතයට යොදාගෙන නොමැති නම් **රජයේ ඉඩම් සන්තකය නැවත පවරාගැනීමේ පනතේ විධිවිධාන** අනුව කොමිෂන් සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර, වගා නොකර පුරන්ව පවතින කුඹුරු ඉඩම් සන්තකය ආපසු පවරා ගැනීමේදී **ගොවිජන සේවා පනතේ නීතිරීතීන්ටද** යටත්ව කටයුතු සිදුකළ යුතුය.

16. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් වල, ඛනිජ සම්පත් සහිත ඉඩම්, සංචාරක ආකර්ශනය සහිත ඉඩම් සහ වානිජමය වටිනාකමක් සහිත ඉඩම් පවරා දීමේදි එම ඉඩම් වල පිහිටීම සම්බන්ධයෙන් විමර්ශන අංශයේ ස්වාධීනව අධ්‍යයනයක් කර අවශ්‍ය නිර්දේශ සහිතව කොමිෂන් සභාවට ඉදිරිපත් කර පවරාදීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සිදුකළ යුතුය.

17. ඉහත වක්‍රලේඛයේ කාණ්ඩ අංක 01, කාණ්ඩ අංක 02 සහ කාණ්ඩ අංක 03 යටතේ බිම් කොටස් නියමානුකූල කිරීම සඳහා නිකුත් කරනු ලබන ඒ.එල්/25 ආකෘති පත්‍රය සහ කාණ්ඩ අංක 03 සඳහා වූ කුඹුරු ඉඩම් පවරාදීමට අදාල ආකෘති පත්‍රය නිකුත් කරනු ලබන අවස්ථාවේදී ඊට අදාළව රු:250.00ක ගාස්තුවක් අයකළ යුතුය. තවද එකී කාණ්ඩ යටතේ ඉඩම් නියමානුකූල කිරීමේදී අදාළ අවස්ථාවන්හිදී තක්සේරු කිරීමේ ගාස්තු, කොමිෂන් සභා ගාස්තු මෙන්ම,මෙහි ප්‍රකාශිතව සඳහන් ගාස්තු සහ, හෝ වෙනත් ගෙවීමක් වෙතොත් එම සියලු ගෙවීම් හා කලින් කලට මධ්‍යම රජය විසින් හෝ පළාත් ආදායම් කොමසාරිස් විසින් හෝ දේපළ අයත් පළාත් පාලන ආයතනය විසින් ගෙවීමට නියම කර ඇති යම්කිසි ගෙවීමක් වේ නම් ඒ සියල්ල සහ දේපළ පවරාදීමේදී දැරිය යුතු මුද්දර ගාස්තුවක් සහ හෝ වෙනත් ඕනෑම නෛතික ගාස්තුවක් වේ නම් එකී සියල්ල ඉල්ලුම්කරු විසින් දැරිය යුතුය.

18. මෙම වක්‍රලේඛයේ ඉඩම් පවරාදීමේ කාණ්ඩ අංක 01 සිට 06 දක්වා පවරාදෙනු ලබන ඉඩම් ඉල්ලුම් කරනු ලබන අදාළ කාර්යය සඳහා පමණක් යොදා ගත යුතුය. එසේ නොකරන අයට විරුද්ධව කොමිෂන් සභාවට ඉදිරිපත් කර කොමිෂන් සභාව විසින් දෙනු ලබන තීරණ අනුව කටයුතු කළ යුතුය.

නිතිඳු පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

19. ඉහත චක්‍රලේඛයේ 03 කාණ්ඩය යටතේ කටයුතු කිරීමේදී කෘෂිකාර්මික කාර්යය සඳහා ඇතුළු වූ බවට තහවුරු කරගැනීමේ ලේඛන වශයෙන් මුල් අද ගොවි සහතිකය ඉදිරිපත් කළ නොහැකි අවස්ථා වලදී, **ගොවි ජන සේවා සංවර්ධන නිලධාරී විසින් වගා කළ වර්ෂය තහවුරු කරන ලද ලිපිය** පාදක කර ගත යුතුය.

20. සුදුසුකම් පරීක්ෂණ පැවැත්වීම මඟින් ප්‍රතිලාභීන් තෝරා ගැනීම.

(අ) කොමිෂන් සභාව සතු, සුදුසුකම් පරීක්ෂණ පැවැත්විය යුතු කෘෂිකාර්මික සහ වතු ඉඩම් පිළිබඳ තොරතුරු හා අයදුම්පත්‍රය පිළිබඳ තොරතුරු නියමිත ආකෘතියේ ගැසට් කිරීමටත් ඊට අමතරව කොමිෂන් සභාවේ වෙබ් පිටුවේ පල කිරීමට පියවර ගත යුතුය.

(ආ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව සුදුසුකම් පරීක්ෂණ මඟින් නේවාසික කටයුතු සඳහා පනතේ 22 (1) ඇ වගන්තිය යටතේ නව ඉඩම් බෙදා දීමේදී සුදුසුකම්ලාභීන් තෝරාගැනීමේදි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකු, අධ්‍යක්ෂ ඉඩම් හෝ ඉඩම් විසින් පත් කරනු ලබන සමාජිකයින් තිදෙනෙකු සහ දිස්ත්‍රික් අධ්‍යක්ෂකගෙන් සැදුම්ලත් නිලධාරින් මණ්ඩලයක් මඟින් පහත නිර්ණායක මත සුදුසුකම් පරීක්ෂණ පැවැත්විය යුතු අතර ලබා දෙන ඉඩම පිහිටි පළාත් පාලන ආයතනයේ අවම බෙදුම් සීමාව අනුව නේවාසික කටයුතු සඳහා පමණක් බෙදා දිය යුතුය.

I. පවුල් ඒකකයේ මාසික ආදායම

II. පදිංචි ස්ථානය තහවුරු කර ගැනීම

III. විවිහාක / අවිවාහක

IV. පවුල් ඒකකයේ යැපෙන්නන් (දරුවන් ගණන)

V. පදිංචිය හෝ කෘෂි කර්මාන්තය සඳහා වෙනත් ඉඩම් නොමැති බව

VI. පවුල් තත්ත්වය (වැන්දඹු, කාලතුරුයා හැර යාම හෝ අබාධිත හෝ විශේෂ අවස්ථාවන් සහිත සමාජිකයන් පවුලේ සිටිද යන වග)

(ඇ) ඉල්ලුම්පත්‍ර කැඳවීම.

අයදුම්කරුවන් වෙතින් නියමිත ආකෘති පත්‍රය සම්පූර්ණකර ප්‍රධාන කාර්යාලයට හෝ දිස්ත්‍රික් කාර්යාල වලට ලබාගත යුතු අතර, එම ඉල්ලුම් පත්‍රය සම්පූර්ණකර බාරදීම කොමිෂන් සභාව සතු ඉඩමක් ලබාදෙන බවට පොරොන්දුවක් හෝ ගිවිසුමක් සේ නොසැලකිය යුතුය.

(ඈ) නව ඉඩම් ඉල්ලීමේ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් නොමැති පුද්ගලයන්

I. දැනටමත් ස්ථිර නිවාස සහ ඉඩම් හිමි අය,

II. ශ්‍රී ලාංකිකයන් නොවන පුද්ගලයන්,

III. මීට පෙර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හෝ කිසියම් රාජ්‍ය ආයතනයකින් සුදුසුකම් ලාභියෙකු වශයෙන් තෝරාගෙන ඉඩම් කොටසක් ලබාදී ඇති සහ හෝ විකුණා ඇති අයෙකු වීම,

IV. වයස අවු:18ට අඩු පුද්ගලයින්,

V. මීට පෙර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් ඉඩම් ලබාගෙන ඇති පුද්ගලයින්

- තෝරා ගැනීමේ පරීක්ෂණ

I. ලැබී ඇති ඉල්ලීම් ප්‍රමාණය සලකා බලා අවස්ථානුකූලව පැවත්විය යුතුය.

II. තෝරා ගැනීමේ පරීක්ෂණය සඳහා අදාළ ඉල්ලුම්කරු පුද්ගලිකවම පෙනී සිටිය යුතුය.

නීතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

III. සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කළ අයදුම්කරුවෙකු සුදුසුකම්ලාභියෙකු වශයෙන් තෝරා ගැනීමෙන් පසුව වැරදි තොරතුරු ඉදිරිපත් කොට ඇති බව අනාවරණය වුවහොත් අදාළ තැනැත්තා නුසුදුස්සෙකු වශයෙන් නම් කිරීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපතිවරයාට බලය ඇත.

21. කොමිෂන් සභාව සතු ඉඩම් වල අනවසර සන්තකය දරන්නා වූ තැනැත්තන් පිළිබඳ දිස්ත්‍රික් කාර්යාලය විසින් ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර එම ලේඛනය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යා යුතුය. ඊට අදාළ වගකීම ඉටු නොකරනු ලබන දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලයේ කලාප සහකාර අධ්‍යක්ෂවරුන් ඇතුළු වගකිවයුතු සියලු නිලධාරීන් සම්බන්ධව විනයානුකූල පියවර ගත යුතුය.

22. ඉඩම් විකිණීමෙන් පවරා දීමේදී ගෙවිය යුතු මුදල ලිඛිතව දන්වා මාස 03 ක් තුල ගෙවා අවසන් කළයුතු අතර මුදල් ගෙවීම් කිරීම් කාලය ඉක්මවන්නේ නම්, ප්‍රමාදිත කාලය සඳහා 10% ක අධිභාරයක් අය කළ යුතුය. තවද, ඔප්පුව ලබාදීමට ප්‍රථම අදාල මුදල ගෙවා අවසන් බව තහවුරු කරගැනීමට කටයුතු කළයුතුය.

B. බදු පදනම මත ඉඩම් බැහැර කිරීමේ ක්‍රමවේදය

මෙම වක්‍රලේඛණයේ කාණ්ඩ අංක 07 සහ 08 ට අදාලව හා ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1)අ, 22(1) ආ ආ, 22(1) ඉ, 42 (අ අ), 42 (ඌ) වගන්තිය යටතේ කොමිෂන් සභාව සතු ඉඩම් සඳහා බදු ගිවිසුම් නිකුත් කිරීමේදී පහත පරිදි කටයුතු කළ යුතුය.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු පහත කාණ්ඩයන් යටතට ගැනෙන ඉඩම් බදු පදනම යටතේ ලබා දිය යුතු අතර, ඊට අදාළ බදු නියෝග අනුගමනය කල යුතුය.

1. අක්කර 05 ට අඩු ඉඩම් කෘෂිකාර්මික කටයුතු සඳහා බදු පදනම යටතේ ලබාදීම.

2. අක්කර 05 ට අඩු ඉඩම් කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා බදු පදනම යටතේ ලබාදීම.

3. අක්කර 05 ට වැඩි ඉඩම් කෘෂිකාර්මික කටයුතු සඳහා බදු පදනම යටතේ ලබාදීම.

4. අක්කර 05 ට වැඩි ඉඩම් කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා බදු පදනම යටතේ ලබාදීම.

5. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් කාර්මික ජනපද සහ කර්මාන්තපුර සඳහා ලබා දීමේදී එහි ඉඩම් කොටස් බදු පදනම යටතේ ලබාදීම.

6. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම්වල මතුපිට හා භූගතව පවත්නා ඛණිජ සම්පත් බදුදීම.

7. දීර්ඝ කාලීනව බුක්තියේ සහ පදිංචියේ සිටින, මෙම වක්‍රලේඛණය යටතේ විකිණීමෙන් පවරාදීම ආවරණය නොවන ඉඩම් කොටස් බදු පදනම යටතේ ලබාදීම.

8. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් කොටස්තුල පවත්වාගෙන යනු ලබන කඩ කාමර බදු දීම.

9. පූජනීය ස්ථාන, පුන්‍යාහාර ඇතුලු ලාභ අරමුණු කර නොගත් ආයතන සඳහා ඉඩම් කොටස් බදු පදනම යටතේ ලබා දීම.

10. සමිති සමාගම් සහ පලාත් පාලන ආයතන වෙත ඉඩම් කොටස් බදු පදනම යටතේ ලබාදීම.

11. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ගොඩනැගිලි බදු පදනම යටතේ ලබාදීම.

12. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කුඹුරු ඉඩම් බදු පදනම යටතේ ලබාදීම.

නීතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

1. අක්කර 05 ට අඩු ඉඩම් කෘෂිකාර්මික කටයුතු සඳහා බදු පදනම යටතේ ලබාදීම.

1.1 තනි පුද්ගල හෝ තනි පුද්ගල නොවන හවුල් ව්‍යාපාරයක් හෝ සමාගමක් නමින් ඉල්ලුම් කල හැකි අතර, උප ලේඛණ අංක 1 සහ 2යටතේ හා පනතේ 22(1) අ සහ 42 ඌ (1) (අ) වගන්තියේ විධිවිධාන පරිදි බදු පදනම යටතේ ලබාදීමට ඉදිරි පියවර ගැනීම සිදුකළ යුතු වේ.

2. අක්කර 05 ට අඩු ඉඩම් කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා බදු පදනම යටතේ ලබාදීම.

2.1 තනි පුද්ගල හෝ තනි පුද්ගල නොවන හවුල් ව්‍යාපාරයක් හෝ සමාගමක් නමින් ඉල්ලුම් කල හැකි අතර, උප ලේඛණ අංක 1 සහ 2 යටතේ හා පනතේ 22(1) ආ ආ හෝ 42 ඌ 1 (අ අ) වගන්තියේ විධිවිධාන පරිදි බදු පදනම යටතේ ලබාදීමට ඉදිරි පියවර ගැනීම සිදුකළ යුතු වේ.

3. අක්කර 05 ට වැඩි ඉඩම් කෘෂිකාර්මික කටයුතු සඳහා බදු පදනම යටතේ ලබාදීම.

3.1 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගමක් විසින් ඉල්ලුම්කර තිබිය යුතු අතර, උප ලේඛණ අංක 1 සහ 2 යටතේ හා පනතේ 22(1) ආ ආ හෝ 42 ඌ 1 (අ) වගන්තියේ විධිවිධාන පරිදි බදු පදනම යටතේ ලබාදීමට ඉදිරි පියවර ගැනීම සිදුකළ යුතු වේ

4. අක්කර 05 ට වැඩි ඉඩම් කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා බදු පදනම යටතේ ලබාදීම.

- 2007 අංක 07 දරණසමාගම් පනත යටතේලියාපදිංචි සමාගමක් විසින් ඉල්ලුම්කර තිබිය යුතු අතර, උප ලේඛණ අංක 1 හා 2 යටතේ හා පනතේ 22(1) ආ ආ හෝ 42 ඌ 1 (අ අ) වගන්තියේ විධිවිධාන පරිදි බදු පදනම යටතේ ලබාදීමට ඉදිරි පියවර ගැනීම සිදුකළ කල යුතු වේ.

5. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් කර්මාන්තපුර හා කාර්මික ජනපද සඳහා බදු පදනම යටතේ ලබාදීම

- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩමක් කර්මාන්තපුරයක් හෝකාර්මික ජනපදයක් ආරම්භ කිරීම සඳහා හඳුනා ගත්තේ නම් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නිරීක්ෂණ සමග කර්මාන්ත අමාත්‍යාංශය මගින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතියක් ලබාගෙන ඉදිරිපත් කල යුතු වේ. ඒ අනුව අදාළ ඉඩම් කොටස කර්මාන්ත අමාත්‍යාංශයේ විධිවිධානයන් අනුව මැණුම් කර කර්මාන්තකරුවන් තෝරාගෙන ඉදිරිපත් කල පසුව ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1) ආ ආ සහ 42 ඌ (1)42 (අ), 42ඌ (1)(අ අ)වගන්තිය යටතේ බදු පදනම් මත ලබා දිය යුතුය.

6. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම්වල පවත්නා ඛණිජ සම්පත් බදුදීම.

6.1 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම්වල භූමිය මතුපිට සහ අභ්‍යන්තරයෙහි පවතින කළුගල්, මැණික්, සිලිකා, ඩොලමයිට්, මිනිරන්, වැලි, පස්, බොරළු සහ අනෙකුත් ඛණිජ සම්පත් බදු පදනම යටතේ ලබා දීමේදී ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1) ආ ආ / 24 (1) සහ 42 ඌ, (1) (අ අ) වගන්ති යටතේ වාර්ෂික බලපත්‍රයක් මගින් ලබාදීම කල යුතුය.

6.2 මෙම ගණයට කොමිෂන් සභාව සතු ඉඩම් වල තිබෙන කළුගල්, වැලි, පස්, මැටි, මිනිරන් සිලිකා ආදි ඛනිජ සම්පත් බැහැර කිරීමේදී පහත සඳහන් ක්‍රමවේදයට අදාලව කටයුතු කළ යුතුය.

6.3 අදාල ඛනිජ ව්‍යාපෘතිය සඳහා ලබාදුන් ඉඩම් කොටස වෙනුවෙන් රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ ඉඩමේ නොදියුණු තක්සේරුව හුක්තියට පැමිණි වර්ෂයේ සිට වසර 05 න් 05ට සමාලෝචනය කරමින් අය කළ යුතු අතර ඉඩමේ අභ්‍යන්තරයේ පිහිටි පහත සඳහන් වනජ ද්‍රව්‍ය එක්රැස් කිරීම වෙනුවෙන් බදු මුදලට අමතරව අදාල ගාස්තු අය කළ යුතුය.

නිතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

අනු අංකය	ඛනිජ සම්පත්	කියුබ් 01 සිට 1000 දක්වා අයවිය යුතු මුදල	කියුබ් 1000 ට වැඩි ප්‍රමාණ සඳහා අයවිය යුතු මුදල
01	කළුගල්	රු: 500.00	රු: 500.00
02	වැලි	රු:2,000.00	රු:3,000.00
03	මතුපිට පස්/මැටි	රු:1,500.00	රු:2,000.00
04	යටි පස්	රු:1,500.00	රු:2,000.00
05	සිලිකා/මිනිරන්/මයිකා	රු:5,000.00	රු:10,000.00
06	තිරිවානා/ ෆෙල්ස්පාර්	රු:2,000.00	රු:3,000.00
07	ගල්/බොරළු/කබොක්	රු: 1,000.00	රු:1,500.00
08	හුණුගල්	රු:1,000.00	රු:1,500.00
09	අනෙකුත් ඛනිජ හෝ ගල් සහිත ද්‍රව්‍ය	කොමිෂන් සභාවට ඉදිරිපත් කර තීරණයක් ගත යුතුය.	

6.4 කළුගල් බදු දීමේදී පහත දැක්වෙන ආයතනයන්හි නිර්දේශ සහිතව ඉල්ලීම ඉදිරිපත් කළ යුතු අතර අදාල ඉල්ලීම කොමිෂන් සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අදාළ ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අවසරය ආකෘති පත්‍ර අංක 2 මගින් රජය සතු ඉඩම්වල කළුගල්, සිලිකා, ඩොලමයිට්, මිනිරන්, වැලි, පස්, බොරළු කැණීම සඳහා භූමිය පරිහරණය කිරීමේ එකඟතාවය ලබාදීමේ ලිපිය භූ විද්‍යා හා පතල් කාර්යාංශයට යොමු කල යුතුය.

I. භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශයේ නිර්දේශය
II. ප්‍රාදේශිය ලේකම් කාර්යාල නිර්දේශ
III. පරිසර අධිකාරියේ නිර්දේශය
IV. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිර්දේශය

මෙම බදුදීම් වෙනුවෙන් භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයට ව්‍යාපෘතිකරු ගෙවනු ලබන රාජ්‍ය භාගය පදනම්ව ගණනය කරන ලද කියුබ් ප්‍රමාණයට බදු මුදල් අය කිරීම.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් පහත සඳහන් පරිදි කාර්මික කැණීම් බලපත්‍ර පදනම් කරගෙන ආරක්ෂිත තැන්පතු මුදලක් ලෙස කාර්තුවකට අදාළ මුදල තැන්පත් කරගනු ලැබේ.

කාර්මික කැණීම් "අ" වර්ගය	IML "A"	මසකට කියුබ් 2000 වැඩි	ආරක්ෂක තැන්පතු මුදල බල පත්‍රය පදනම්ව අය කරගනු ලැබේ.
කාර්මික කැණීම් "ආ" වර්ගය	IML "B"	මසකට කියුබ් 2000 අඩු	3600000.00 X ¼ = 900000.00
කාර්මික කැණීම් "ඇ" වර්ගය	IML "C"	මසකට කියුබ් 1000 නොවැඩි	1800000.00 X ¼ = 450000.00
කාර්මික කැණීම් "ඈ" වර්ගය	IML "D"	මසකට කියුබ් 500 නොවැඩි	900000.00 X ¼ = 225000.00

6.5 717 වෙනි කොමිෂන් සභා වාරයේදී ඉදිරිපත් කරන ලද 10454 පත්‍රිකාව සඳහා 2019.01.17 දිනැතිව කොමිෂන් සභා තීරණයට අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ/මැණුම්ගේ අනුමැතිය ලද පිඹුරු පතක බලයලත් මානකවරයෙකු විසින් ලකුණු කරන ලද පර්වස් 01 ක ප්‍රමාණය සඳහා වර්ෂයකට රු.40,000.00 ක මුදලක් අය කර කැණීම් නිර්දේශය ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ දිස්ත්‍රික් අධ්‍යක්ෂ වෙත ලබා දිය යුතුය.

නිතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

බලපත්‍ර කාලය දීර්ඝ කිරීමේදී අයකරනු ලබන රු.40,000/- මුදලට 25% ක් එකතුකර අය කළ යුතුය.

7. දීර්ඝ කාලීනව බුක්තියේ සහ පදිංචියේ සිටින, මෙම වක්‍රලේඛණයෙන් ආවරණය නොවන ඉඩම් කොටස් බදු පදනම යටතේ ලබාදීම.

7.1 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම්වල දීර්ඝ කාලයක සිට බුක්තියේ සහ පදිංචියේ සිටින පුද්ගලයන්ගේ ඉඩම් කොටස් මෙම වක්‍රලේඛණයෙන් ආවරණය නොවන අවස්ථාවක එම කොටස් ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1) ආ ආ , 42 (1)ඌ අ සහ 42(1)ඌ (අ අ) වගන්තිය යටතේ බදු පදනම යටතේ ලබා දිය යුතුය. මේ සඳහා බදු නියෝග අදාළ කරගත යුතුය.

8. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් කොටස්තුල පවත්වාගෙන යනු ලබන කඩ කාමර බදු දීම.

8.1 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් කොටස්තුල පවත්වාගෙන යනු ලබන කඩ කාමර මෙම වක්‍රලේඛණයෙන් ආවරණය නොවන අවස්ථාවක එම කඩ කාමර ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1) ආ ආ , 42 (1)ඌ අ සහ 42(1)ඌ (අ අ) වගන්තිය යටතේ බදු පදනම් මත ලබාදිය යුතුය.

9. පූජනීය ස්ථාන, පුනුභාර ඇතුලු ලාභ අරමුණු කර නොගත් ආයතන සඳහා ඉඩම් කොටස් බදු පදනම යටතේ ලබා දීම.

9.1 ලාභ අරමුණින් තොරව පවත්වාගෙන යනු ලබන පූජනීය ස්ථාන, පුනුභාර ඇතුලු ලාභ අරමුණු කර නොගත් ආයතනසඳහා ඉඩම් කොටස් ලබාදීමේදී ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1) ආ ආ වගන්තිය යටතේබදු පදනම් මත ලබාදිය යුතුය.

10. සමිති සහ පළාත් පාලන ආයතන වෙත ඉඩම් කොටස් බදු පදනම යටතේ ලබාදීම

10.1 සමිති සහ පළාත් පාලන ආයතන වෙත ඉඩම් කොටස් ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1) ආ ආ වගන්තිය සහ 42 (1)ඌ (අ අ) වගන්තිය යටතේ බදු පදනම් මත ලබාදිය යුතුය.

11. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ගොඩනැගිලි බදු පදනම යටතේ ලබාදීම

11.1 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව ඇති සහ සතු වන්නා වූ ගොඩනැගිලි ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1) ආ ආ , 42 (1)ඌ අ සහ 42(1)ඌ (අ අ) වගන්තිය යටතේ බදු පදනම් මත ලබාදිය යුතුය

12 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කුඹුරු ඉඩම් බදු පදනම යටතේ ලබාදීම

12.1 මෙම වක්‍රලේඛණය යටතේ විකිණීමෙන් පවරාදීම ආවරණය නොවන කුඹුරු ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1) අ වගන්තිය සහ 42 (1)ඌ අ වගන්තිය යටතේ බදු පදනම් මත ලබාදිය යුතුය.

<u>බදු නියෝග</u>

1. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් බදු පදනම් මත ලබාදීමේදී තරඟකාරී ටෙන්ඩර් ක්‍රමය යටතේ පමණක් ලබා දිය යුතු අතර ඇතැම් විශේෂිත අවස්ථා වලදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය යටතේ ලබා දිය යුතුය. කොමිෂන් සභාව සතු ඉඩම් පිළිබඳ විස්තර අන්තර්ජාලයේ හා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් හරහා ප්‍රසිද්ධියට පත් කළ යුතු අතර ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය සහිතව බදු ආකෘති පත්‍ර 2024/B/01යටතේ ඉල්ලුම්පත් කැඳවිය යුතුය.අදාල අයදුම්පත්‍ර ප්‍රධාන කාර්යාලය මඟින් හෝ දිස්ත්‍රික් කාර්යාල මඟින් ආපසු නොගෙවනු ලබන රු.1000.00ක

නීතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

තැන්පතු මුදලක් ගෙවා ලබා ගත යුතුය. එසේ නොමැති නම් කොමිෂන් සභාවේ වෙබ් පිටුවෙන් බාගත කර ගැනීමෙන් පසු රු.1000.00ක මුදලක් සමඟ ප්‍රධාන කාර්යාලයට හෝ දිස්ත්‍රික් කාර්යාලය වෙත අයදුම්පත් භාරදිය හැකිය. අයදුම්පත් භාර ගැනීමේදී ව්‍යාපෘති වාර්තා, මූල්‍ය වාර්තා හා ශක්‍යතා වාර්තා ඉදිරිපත් කළ යුතු අතර ව්‍යාපෘති ඇගයීම් කමිටුව හරහා වැඩිම ලංසු ඉල්ලුම් සහිත බදුකරු තෝරා ගෙන කොමිෂන් සභා අනුමැතිය පරිදි ඉදිරි කටයුතු සිදු කිරීම.

2. ඉහත නියෝග 1 යටතේ වූ අක්කර 05 ට අඩු ඉඩම් කොටස් කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා බදු පදනම යටතේ ලබා දීමේදී විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය.

3. ඉහත නියෝග 1 යටතේ වූ අක්කර 05 ට වැඩි ඉඩම් කොටස් කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා බදු පදනම යටතේ ලබා දීමේදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය.

4. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් බදු පදනම යටතේ ලබා දීමේදී එම ඉඩමේ භුක්තිය භාර දෙන දින සිට හෝ කොමිෂන් සභා තීරණයේ සඳහන් පරිදි වසර 30 ක කාලයක් සඳහා බදු පදනම යටතේ ලබාදිය යුතුය.

5. බදු පදනම යටතේ ඉඩම් කොටස් ලබාදීමේදී භුක්තිය භාරදෙනු ලබන දිනට අදාළ රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරනු ලබන, ඉඩමේ නොදියුණු තක්සේරුව පදනම් කරගෙන බදු පදනම යටතේ ලබා දිය යුතුය. කිසියම් අවස්ථාවකදී ඉඩමේ භුක්තිය කඩිනමින් භාරදීමට අවශ්‍ය වුවහොත් දළ තක්සේරුව මත භුක්තිය භාරදී රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ලැබීමෙන් පසු අවශ්‍ය ගැලපීම් සිදු කිරීම හා බදු ගිවිසුමක් ලබා දීම.

6. බදු පදනම යටතේ ලබා දීමේදී වසර 05 කට වරක් බදු සංශෝධනය සිදු කර වාර්ෂික බදු ගැලපීම් සිදු කල යුතුය.

7. ඉඩම් කොටසක් බදු පදනම යටතේ ලබා දීමේදී බුක්තිය භාරදීමට පෙර, වසර දෙකකට (02) අදාළ වාර්ෂික බදු මුදලක් ගෙවිය යුතුය. එසේම, රජයේ තක්සේරුව ලැබී නොමැති නම් දළ තක්සේරුවක් මත කටයුතු කල යුතු අතර, රජයේ තක්සේරුව ලැබී අවශ්‍ය ගැලපීම් සිදුකර අයවිය යුතු මුදල අයකර ගැනීමෙන් පසු ලිත් මසක් තුළ බදු ගිවිසුම ලබා දිය යුතුය.

8. භුක්තිය බදුකරුට භාරදී අදාළ භුක්තිය භාරදීමේ ලේඛණ සහ ඉඩම් කොටසේ තත්ත්ව වාර්තාවක් දිස්ත්‍රික් අධ්‍යක්ෂ විසින් අධ්‍යක්ෂ/ ව්‍යාපෘති සහ අධ්‍යක්ෂ/ ආදායම් වෙත ඉදිරිපත් කළ යුතුය.

9. ලිත් මසක් ඇතුලත අදාළ බදු මුදල් ගෙවා ඉඩමේ භුක්තිය භාර ගැනීමට බදුකරු ඉදිරිපත් නොවන්නේ නම්, එවැනි අවස්ථාවකදී බදු දීම අවලංගු කළා සේ සලකනු ලැබේ.

10. නව බදු ලබාදීමේදී ඉඩම් කොටසේ භුක්තිය භාර දී මාස 06 ක් ඇතුලත එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන්නේද යන්න දිස්ත්‍රික් අධ්‍යක්ෂ විසින් අධ්‍යක්ෂ/ ව්‍යාපෘති වෙත හා අධ්‍යක්ෂ/ආදායම් වෙත වාර්තා කල යුතුය.

11. පුජනීය ස්ථාන, පුණ්‍යභාර ඇතුලු ලාභ අරමුණු කර නොගත් ආයතන, සමිති සහ පළාත් පාලන ආයතන සඳහා ඉඩම් කොටස් බදු පදනම යටතේ බදුදීමේදී රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වටිනාකමින් 2% ක බදු ප්‍රතිශතයක් වාර්ෂිකව අය කල යුතුය

12. කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් බදුදීමේදී රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වටිනාකමින් 4% ක බදු ප්‍රතිශතයක් වාර්ෂිකව අය කල යුතුය

13. කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා ඉඩම් බදුදීමේදී රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වටිනාකමින් 6% ක බදු ප්‍රතිශතයක් වාර්ෂිකව අය කල යුතුය

14. වාර්ෂික බදු මුදල් නිසි පරිදි නොගෙවීමේදී වසරකට 10% ක ප්‍රමාද ගාස්තුවක් අය කල යුතුය.

නිතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

15. නව ඉඩම් කොටස් බදු දීමේදී එම ඉඩම් කොටස් සම්බන්ධව වසරකට දෙවරක් දිස්ත්‍රික් අධ්‍යක්ෂ විසින් නිරීක්ෂණ වාර්තාවක් අධ්‍යක්ෂ/ව්‍යාපෘති හා අධ්‍යක්ෂ/ආදායම් වෙත ලබා දිය යුතුය.

16. බදු පදනම් යටතේ ලබා දී ඇති කිසිදු ඉඩම් කොටසක් තුන්වන පාර්ශවයක් වෙත ලබා දීමට බදුකරුට නෛතික බලයක් නොමැති බැවින් එවැනි ක්‍රියාවක් වාර්තා වුවහොත් දිස්ත්‍රික් අධ්‍යක්ෂ විසින් එම තත්ත්වය වහාම සභාපති වෙත වාර්තා කළ යුතුය.

17. ඉහත 16 ට අදාලව තුන්වන පාර්ශවය විසින් ඉල්ලීමක් ඉදිරිපත් කළ විට කොමිෂන් සභා අනුමැතිය ලබාගැනීමෙන් පසු එම කරුණට අදාලව වාර්ෂික බදු මුදලින් 15% ක දඩ මුදලකට යටත්ව නියමානුකූල කිරීම.

18. අතුරු බදු දීමක් සිදුකර තිබියදී එම තත්ත්වය මාස 06 ක් ඇතුලත දිස්ත්‍රික් අධ්‍යක්ෂ විසින් අධ්‍යක්ෂ/ව්‍යාපෘති සහ අධ්‍යක්ෂ/ආදායම් වෙත වාර්තා කර නොමැති අවස්ථාවකදී එම ගැටළුව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර දිස්ත්‍රික් අධ්‍යක්ෂට සහ ක්ෂේත්‍රය භාර නිලධාරි වෙත විනය ක්‍රියා මාර්ග ගැනීමට ද කටයුතු කල යුතුය.

19. බදු පදනම් මත ලබා දී ඇති ඉඩම් කොටස් සඳහා වසරකට වැඩි කාලයකට වාර්ෂික බදු ගෙවීම් භිගයක් ඇති වුවහොත් ඒ සඳහා නිසි නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීති අංශය වෙත අධ්‍යක්ෂ/ආදායම් සහ අධ්‍යක්ෂ/ව්‍යාපෘති විසින් වාර්තා කල යුතු අතර, අධ්‍යක්ෂ/නීතිගේ උපදෙස් මත ඉදිරි ක්‍රියා මාර්ග අනුගමනය කල යුතුය.

20. වසර 05 කට අඩු කාලයක් සඳහා බදු ගිවිසුම්ගත වීමේදී එකවර බදු මුදල් අයකර ගැනීම් කළ යුතුය.

21. බදු පදනම් යටතේ ලබා දී ඇති ඉඩම් කොටසක් අදාළ බදුකරුට නියමිත පරිදි පරිපාලනය කිරීමේ අපහසුතාවයක් හෝ වෙනයම් හේතුවක් මත ඉදිරියට පවත්වාගෙන යා නොහැකිනම් එම ඉඩම් කොටස කොමිෂන් සභාව වෙත පවරාගෙන බදු ප්‍රතිපත්තිය අනුව කටයුතු කළ යුතුය.

22. පවත්වාගෙන යා නොහැකි ව්‍යාපෘතියක් භදුනාගත් අවස්ථාවක එම ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත භාරගත යුතු අතර,භාර ගැනීමේදී එහි තත්ත්ව වාර්තාවක් ලබාගත යුතුය.

23. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත භාර ගන්නා ලද ඉඩම් කොටසක් වෙනත් බදුකරුවෙකුට ලබාදීමේදී එම ඉඩමේ සංවර්ධන වටිනාකම මත රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ලබාගෙන ඉදිරි කටයුතු කල යුතුය.

24. දීර්ඝකාලීනව පදිංචියේ සහ භුක්තියේ සිටින කඩ කාමර සහිත ඉඩම් කොටස් මෙම වක්‍රලේඛණයෙන් ආවරණය නොවන අවස්ථාවකදී එම ඉඩම් බදු පදනම් යටතේ ලබාදිය යුතු අතර, භුක්තිය තහවුරු කරන දිනයේ සිට බදු දෙන දිනය දක්වා එක් කඩ කාමරයක් සඳහා රු.2000/- ක වාර්ෂික පරිහරණය මුදලක් අය කල යුතුය.

25. බදු පදනම් යටතේ ලබා දී ඇති කිසිදු ඉඩම් කොටසක් නිතිමය බැඳීම් සඳහා හෝ විකිණීමේ පදනම් මත ලබාදීම් නොකල යුතුය.

26. කර්මාන්තපුර හා කාර්මික ජනපද ව්‍යාපෘති සඳහා ඉඩම් කොටස් ලබා දීමේදී එම ජනපදයේ කර්මාන්තකරුවන්, කර්මාන්ත අමාත්‍යාංශය විසින් තෝරාදෙනු ලබන දිනයන්ට අදාළව බදු පදනම් යටතේ ලබාදී යුතු අතර, බදුකරු වෙනස් වීමේදී කර්මාන්ත අමාත්‍යාංශය විසින් දැනුම් දෙනු ලබන පරිදි ඉදිරි කටයුතු සිදු කල යුතු අතර, අනෙකුත් සියළු නියෝග මේ සඳහාද අදාළ වේ.

27. ව්‍යාපෘති නාමය වෙනස් කිරීම සිදුකර ඇති අවස්ථා වලදී එයට අනුමැතිය ලබාදෙනුයේ අදාල ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනසක් නොමැති අවස්ථාවකදී පමණක් වන බැවින් නාමය පමණක් වෙනස්කර ගිවිසුම් සැකසීම සඳහා විෂයභාර අමාත්‍ය අනුමැතිය අදාල නොවේ.

නිතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

28. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වී ඇති සහ බදුකරුවන් විසින් ගොඩනගන ලද එහෙත් භුක්තිය අතහැර ඇති කොමිෂන් සභාව සතු වී ඇති ගොඩනැගිලි වෙනත් පුද්ගලයින් වෙත පවරා දීමේදී ඒම ගොඩනැගිලි වලට අදාල රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1% ක් බදු මුදලක් පවරා දෙන දිනට ගාස්තුවක් ලෙස අය කල යුතුය.

29. මෙම වක්‍රලේඛණය යටතේ විකිණීමෙන් පවරාදීම ආවරණය නොවන කුඹුරු ඉඩම් බදු පදනම යටතේ ලබාදිය යුතු අතර, බුක්තිය තහවුරු කරන දිනයේ සිට බදු පදනම මත ලබාදෙන දිනය දක්වා වසරකට අක්කර 01 ක් සඳහා එක් කන්නයකට රුපියල් 1000/- ක ප්‍රවේණි ගාස්තුවක් අය කල යුතුය. බදු දෙනු ලබන දිනයේ සිට රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරනු ලබන තක්සේරු වටිනාකම මත ඉහත අංක 03 හි සඳහන් පරිදි බදු අය කල යුතුය.

30. මෙම වක්‍රලේඛණය යටතේ විකිණීමෙන් පවරාදීම ආවරණය නොවන ඉඩම් කොටස් හා කඩ කාමර අධ්‍යක්ෂ/ ඉඩම් විසින් බදු පදනම යටතේ ලබාදීමට ව්‍යාපෘති අංශය වෙත භාරදිය යුතුය.

31. අක්කර 05 ට වැඩි කෘෂිකාර්මික හෝ කෘෂිකාර්මික නොවන ඉඩම් බදු පදනම යටතේ ලබා දීමේදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් වාර්තා ද සමග අනුමැතියට ඉදිරිපත් කල යුතුය.

- ❖ යෝජිත ව්‍යාපෘතියට අදාළ ව්‍යාපෘති වාර්තාව හා එහි පිටපත් 30 ක්
- ❖ මූල්‍ය ශක්‍යතා වාර්තාව හා එහි පිටපත් 30 ක්
- ❖ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව හා එහි පිටපත් 30 ක්
- ❖ කෙටුම්පත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය හා කොමිෂන් සභා තීරණය ඇතුළු අනෙකුත් ලේඛන

උප ලේඛණ - 1

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන ඉඩම් බදු පදනම මත ලබාදීමේදී ලබාගත යුතු ආයතන නිර්දේශ

13 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩමක් බදු පදනම මත ලබාදීමේදී ව්‍යාපෘතියේ ස්වාභාවය මත සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාවක් ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමෙන් අනතුරුව එම ව්‍යාපෘතියේ ස්වාභාවය මත ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමන්තුවෙන් නිර්දේශ කරනු ලබන යම් ආයතනයක් සඳහා පහත සඳහන් ආයතන එකක් හෝ කිහිපයකින් නිර්දේශ වාර්තා ලබාගත යුතුය.

- ❖ මධ්‍යම පරිසර අධිකාරිය
- ❖ භූගත ජලය භාවිතා කරන්නේ නම් ජල සම්පත් සංවර්ධන මණ්ඩලය
- ❖ ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනය
- ❖ ආයුර්වේද දෙපාර්තමේන්තුව
- ❖ වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- ❖ ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය
- ❖ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
- ❖ සංචාරක අමාත්‍යාංශය
- ❖ පොල් වගා කිරීමේ මණ්ඩලය
- ❖ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
- ❖ බෞද්ධ කටයුතු කොමසාරිස්
- ❖ භූ විද්‍යා හා පතල් කාර්යංශය
- ❖ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
- ❖ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව

උප ලේඛණ - 2

14 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩමක් බදු පදනම මත ලබාදීමේදී ව්‍යාපෘතියේ ස්වාභාවය මත සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාවක් ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම්

නිහඬ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමෙන් අනතුරුව එම ව්‍යාපෘතියේ ස්වාභාවය මත පහත සඳහන් ක්‍රියාවලිය අනුගමනය කල යුතුය.

- ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයට ඉඩම මැණුම් කිරීම
- ඉඩම් පරිහරණ දෙපාර්තමේන්තුවේ පරිහරණ වාර්තාව ලබා ගැනීම
- එම වාර්තාව පදනම් කරගෙන පුවත්පත් දැන්වීම් හා අන්තර්ජාලය ඔස්සේ ඉල්ලුම්පත් කැඳවීම
- ඉල්ලුම්පත් වර්ගීකරණය කිරීම
- තෝරා ගැනීමේ කමිටුවට ඉදිරිපත් කිරීම හා එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම.
- තෝරාගත් ව්‍යාපෘතිකරුවන් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම
- එම තීරණය අනුව කටයුතු කිරීම
- විෂයභාර අමාත්‍යවරයාගේ ඇමති අනුමැතිය යොමු කිරීම
- ඉඩම තක්සේරු කිරීම
- බදු දැන්වීම් යොමු කිරීම
- බදු අය කර ගැනීම (දළ තක්සේරුව මත හෝ)
- බුක්තිය භාරදීම
- බදු ගිවිසුම ලබාදීම
- පසු විපරම් කිරීම

C. නියමිත පරිදි අදාළ බදු මුදල් නොගෙවනු ලබන බදු ගැනුම්කරුවන්ද නීති මඟින් කටයුතු කර නඩු පවරා නෙරපීමට කටයුතු කළ යුතු අතර එසේ නීති මඟින් අදාළ ඉඩම පවරාගැනීමෙන් පසු නැවත සුදුසු ආයෝජකයෙකු වෙත මෙම වක්‍රලේඛයේ 07 සහ 08 වන කාණ්ඩයේ සඳහන් කරුණු වලට යටත්ව නව බදුදීමක් වශයෙන් පවරාදීම සිදුකළ යුතුය.

D. ඉහත වක්‍රලේඛයේ අංක:06 කාණ්ඩය අනුව කෘෂිකාර්මික ව්‍යාපෘති/කෘෂිකාර්මික නොවන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම පුවත්පත් නිවේදන අනුව සහ කොමිෂන් සභාව වෙත යොමුවන ඉල්ලීම් පිළිබඳව සලකා බලා ව්‍යාපෘතියේ ස්වභාවය, දේශීය ආර්ථිකයට සහ සමාජයට වන ප්‍රතිලාභය පිළිබඳවද අවධානය යොමුකර ඊට ප්‍රමුඛතාවය ලබාදී පහත පියවරයන් අනුව පවරා දීම සිදුකළ යුතුය.

I. ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම
II. ක්ෂේත්‍ර වාර්තා (දිස්ත්‍රික් කාර්යාල වලින්) ලබා ගැනීම.
III. ඉඩම් මැනුම් කිරීම.
IV. අදාළ රාජ්‍ය ආයතන නිර්දේශ ලබා ගැනීම. (ඉඩම් පරිහරණ දෙපාර්තමේන්තුව / පරිසර අධිකාරිය ආදි ආයතන ව්‍යාපෘතියේ ස්වභාවය අනුව නිර්දේශ තීරණය කෙරේ.)
V. අනුමැතිය සඳහා ව්‍යාපෘති කමිටුවට යොමු කිරීම.
VI. අනුමැතිය සඳහා කොමිෂන් සභාවට යොමු කිරීම.
VII. අක්කර 05 ට අඩු ඉඩම් සඳහා ගරු ඉඩම් අමාත්‍යතුමාගේ අනුමැතිය ද අක්කර 05 ට වැඩි ඉඩම් සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතියට ද යොමු කිරීම.
VIII. තාවකාලික ගිවිසුමක් සහ බැඳුම්කරයක යටත්ව තක්සේරු අත්තිකාරම් මුදලක් අයකර බුක්තිය භාරදීම.
IX. ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව කැඳවීම.
X. බදු මුදල් අය කිරීම.
XI. භුක්තිය බාර දීම.
XII. බදු ගිවිසුම ලබා දීම.
XIII. පසු විපරම් සිදු කිරීම.

E. ඉහත වක්‍රලේඛයේ 07 වන කාණ්ඩය අනුව ඛනිජ සම්පත් සඳහා බදුදෙන ලද පිඹුරුපත්වල සඳහන් බිම් ප්‍රමාණයට වඩා වැඩිපුර කිසිවෙකු කැණීම් සිදුකරන්නේ නම් කඩිනමින් ප්‍රධාන කාර්යාලය හා

නීතියැද පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

අදාළ අනෙකුත් ආයතන දැනුවත් කිරීමත් එම කැණීම් කටයුතු නතර කරවීමටත් කටයුතු කළයුතු අතර කොමිෂන් සභාව සතු කිසිදු ඉඩමක කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව කැණීම් සිදුකිරීමට ඉඩ සැලසීම නොකළ යුතු අතර, එවැනි කටයුතු සිදුවේ නම් ඒවා අත්හිටුවීමටද එහි වගකීම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරයා විසින් භාරගත යුතුය. තවද කැණීම් සඳහා නිකුත්කර ඇති අවසරපත්‍රයේ සඳහන් කොන්දේසි වලට යටත්ව කටයුතු කරන්නේදැයි පරීක්ෂාකර බලා මසකට වරක් පසුවිපරම් වාර්තාවක් සභාපතිවරයා වෙත යොමුකළ යුතුය.

අර්ථ නිරූපණ

1) **මෙම චක්‍රලේඛය බලපැවැත්වූ දිනය** : මෙම චක්‍රලේඛය යටතේ වන කාරණා සළකා බලන දිනය 2024.07.24 දින හෝ ඊට පසු දිනයක් විය යුතුය. තවද, මෙම චක්‍රලේඛයේ දිනය යන්න යම් තැනක සඳහන් වේද එම දිනය ලෙස ද 2024.07.24 වන දිනය විය යුතුය.

2) **පූජනීය ස්ථාන :- 1931 අංක 19** දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ දෙවන වගන්තියේ 'පන්සල' යනුවෙන් අර්ථ නිරූපනය කර ඇති ස්ථාන හා බෞද්ධ කටයුතු කොමසාරිස් යටතේ ලියා පදිංචි කර ඇති බෞද්ධ විහාරස්ථාන සහ එම පනත යටතේ අර්ථ නිරූපනය කර ඇති දේවාල, ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශය යටතේ සහතික කරන ලද ක්‍රිස්තියානි පල්ලි, 1982 අංක 33 දරන පනතේ 58 වගන්තිය යටතේ සඳහන් මුස්ලිම් පල්ලි සහ පුණ්‍යභාර, හින්දු සංස්කෘතික අමාත්‍යාංශයෙහි ලියාපදිංචි කර ඇති හින්දු කෝවිල්.

3) **පුණ්‍යභාර ඇතුළු ලාභ අරමුණු කර නොගත් ආයතන**:- ලාභ අරමුණකින් තොරවහුදෙක්ම සමාජ සුබසාධනය වෙනුවෙන්ම කටයුතු සිදුකරනු ලබනපුණ්‍ය අරමුදල් ආයතන,සංවිධාන මඟින් පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාස,ළමා නිවාස වැනි ආයතන ආගමික සංවිධාන සහ මරණාධාර සමිති, කාන්තා සමිති, ක්‍රීඩා සමිති,ප්‍රජා ජලයෝජනා සමිති,ගොවි සංවිධාන,වැඩිහිටි සමිති,තරුණ සමාජ,ළමා සමාජ, දිවි නැගුම සමිති සඳහා වන ඇතුළු සුබසාධන සමිති , ආරණ්‍ය සේනාසන සහ භාවනා මධ්‍යස්ථාන මේ යටතට ඇතුලත් වේ.
භාර ආඥා පනතේ 99 වගන්තියේ පුණ්‍යභාර ලෙස දක්වා ඇති අර්ථ නිරූපණය අදාළයි(සංශෝධනයන්ට යටත්ව)

4) **බලපත්‍ර** :- කිසියම් රාජ්‍ය ආයතනයක් විසින් පවත්වන ලද සුදුසුකම් පරීක්ෂණ මඟින් යම් පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් ඉඩම් කොටසක් ලැබීම සඳහා සුදුසුකම්ලාභීන් වශයෙන් තෝරාගෙන ඇති හෝ ගෙන ඇති තීරණයන් අනුව අදාළ පුද්ගලයන්ගේ නම් ඇතුළත්කර සකසනු ලබන ලේඛනයක් හෝ වලංගු ලිඛිත අවසරයක් යන්න සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් නේවාසික කටයුතු සඳහා බලපත්‍රය යනුවෙන් අදහස් වන අතර ඉහතචක්‍රලේඛය අනුව ඉඩම් කොටස් පැවරීමට අදාළ දිනය වශයෙන් බලපත්‍රයේ දිනය සැලකිය යුතුය.

- ඒ අනුව ඒ යටතට, ප්‍රාදේශීය ලේකම්/ උප දිසාපති/ දිසාපති /ආණ්ඩුකාර /ඒජන්ත විසින් නිකුත්කර ඇතිඅවසර පත්‍ර,
- වාර්ෂික බලපත්‍ර කව්චේරියකින් තෝරා ගත් බවට නිකුත් කර ඇති ලිපිය හා ඉඩම් කව්චේරියකින් තෝරා ගත් නාම ලේඛන,
- නිවාස සංවර්ධන අධිකාරිය මඟින් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් පවත්වා ඇති සුදුසුකම් පරීක්ෂණ මඟින් අනුමත නාම ලේඛන,
- රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩය, පට හා සේද අධිකාරිය, කජු සංස්ථාව, ජනාවාස කොමිෂන් සභාව, හදබිම අධිකාරිය වැනි රාජ්‍ය ආයතන විසින් ලබාදී ඇති පිළිගත හැකි ලේඛන.
- 1977 - 94 කාලය තුළ කොමිෂන් පත්‍රිකා ඉදිරිපත් කර කට්ටිකරුවන්ට විකිණීමේ පදනම් මත ඉදිරිපත් කර කොමිෂන් සභා තීරණ මත ලබාදුන් ඉඩම්,

5) **නේවාසික කටයුතු යනු**:- වාසයට සුදුසු පරිදි නිවසක් ඉදිකර ඊට අවශ්‍ය වන මූලික අවශ්‍යතාසපුරා ගනිමින් සාමාන්‍ය එදිනෙදා ජීවන කටයුතු පවත්වාගෙන යමින් වාසය කිරීම අදහස් වේ.

නීතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

6) අනවසරකරු යනු:- ඉහත වක්‍රලේඛයේ 01 වන කාණ්ඩය යටතේ සුදුසුකම්ලාභියෙකු නොවන හෝ වක්‍රලේඛයේ 01 වන කාණ්ඩය යටතේ අදාළ කට්ටිකරු සතු බලපත්‍රයේ සඳහන් ප්‍රමාණයටවැඩිපුර ඇති බිම් ප්‍රමාණයක් නේවාසික හෝ නේවාසික නොවන කටයුතු සඳහා යොදා ගනිමින් එම බිම් කොටස පරිහරණය කරනු ලබන පුද්ගලයා වේ.

7) **පරිහරණ ගාස්තුව:-** ඉඩම් කච්චේරි සහ සුදුසුකම් පරීක්ෂණ මඟින් තෝරාගෙන නේවාසික හෝ නේවාසික නොවන වෙනත් ඕනෑම කටයුත්තක් සඳහා යොදා ගනිමින් එම බිම් කොටස පරිහරණය සහ සුදුසුකම්ලාභීන් සඳහා ලබාදී ඇති මෙම ඉහත අර්ථ නිරූපණ අංක:03 හි සඳහන් පරිදි නිකුත්කර ඇති බලපත්‍රයන්හි නිශ්චිත ප්‍රමාණයක් සඳහන් වේ නම් ඊට අදාළව එම ඉඩම් ප්‍රමාණය සඳහා නිශ්චිත කාලසීමාවක් තුළ එමනිශ්චිතඉඩම් ප්‍රමාණය බලපත්‍රය මත පරිහරණය කිරීම වෙනුවෙන් ඉඩම් කට්ටිකරුවෙකු ගෙවිය යුතු මුදල පරිහරණ ගාස්තුව වේ.

8) **අනවසර පරිහරණය:-** ඉහත සඳහන් බලපත්‍රයේ නිශ්චිත ප්‍රමාණයක් සඳහන් නොවේ නම් කට්ටිකරුට පැවරීමට යෝජිත ඉඩමේ ප්‍රමාණය සහ මෙම වක්‍රලේඛයේ 02 වන කාණ්ඩය සම්බන්ධ ඉඩම් වේ.

9) අඩු ආදායම්ලාභියා :- රජයේ අඩු ආදායම්ලාභී සහනාධාර වැඩ සටහන් යටතේ (උදා:- වර්තමාන අස්වැසුම ප්‍රතිලාභීන්)ප්‍රතිලාභ ලබනපුද්ගලයින්

මෙම වක්‍රලේඛය බලපවත්වන කාලය තුළ මෙම වක්‍රලේඛයේ බලපවත්නා කාරණා ක්‍රියාවට නැංවීමේදී යම් ගැටළුකාරී තත්ත්වයක් පැනනැගුණ හොත් කොමිෂන් සභාවේ ඕනෑම සේවකයකු විසින් ඔහුගේ හෝ ඇයගේ ප්‍රධානියා මඟින් කොමිෂන් සභාවේ සභාපතිතුමා මඟින් කොමිෂන් සභාවට එකී ගැටළු හා ඒ සම්බන්ධයෙන් ඇති යෝජනා ඉදිරිපත් කර කොමිෂන් සභා තීන්දුවක් ලබා ගැනීමට කටයුතු කල යුතුය.

නීතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

නීතිඥ පණ්ඩුක කීර්තිනන්ද,
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

සැ.යු.:- මෙම වක්‍රලේඛයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

මගේ අංකය :- 2/1/145/ IV
කළමණාකරන හා මානව සම්පත් සංවර්ධන අංශය,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
බත්තරමුල්ල.

2024.08.28 වන දින

සියළුම කලාප සහකාර අධ්‍යක්ෂවරුන් වෙත,
දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් පැවරීම් විෂයෙහිලා වූ 2024/03 නව වක්‍රලේඛයේ සඳහන් වගන්ති සංශෝධනය කිරීම.

වරින්වර සංශෝධිත 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ මෙම කොමිෂන් සභාවට ප්‍රකාශිතව පැවරී ඇති ඉඩම් භාහිර පාර්ශවයන් වෙත පනතේ විධිවිධානයන්ට අනුකූලව විකිණීම, බදු දීම හා බලපත්‍ර මඟින් පැවරීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේද ඇතුලත් 2024/03 වක්‍රලේඛය 2024.07.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

02. ඒ අනුව, මගේ සමාංක 2/1/145/ IV හා 2024.07.24 දිනැති ලිපිය මඟින් උක්ත විෂයෙහිලා ඉඩම් පැවරීමේදී එකී ක්‍රියාමාර්ග 2024.07.24 දින සිට ක්‍රියාත්මක විය යුතු බවට දැනුවත් කර ඇත. තවද, එම පාලන වක්‍රලේඛ අංක 2024/03 හි සඳහන් වගන්ති වන, බදු නියෝග යටතේ වූ බදු නියෝග අංක 2, උපලේඛණ - 2හි 14. D. වගන්තිය සහ එහි VII උප වගන්තිය සහ E වගන්තිය යන වගන්තීන් මඟින් ලබා දී ඇති උපදෙස් පහත සඳහන් පරිදි සංශෝධනය වන බව මෙයින් දන්වා සිටිමි. එකී සංශෝධනයන්ට අනුගතව 2024/03 වක්‍ර ලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කල යුතු බව මෙයින් වැඩිදුරටත් උපදෙස් දෙමි.

වක්‍රලේඛයේ සඳහන් ආකාරය	සංශෝධන කරන ලද ආකාරය
බදු නියෝග 2 හි; "ඉහත නියෝග 1 යටතේ වූ අක්කර 05 ට අඩු ඉඩම් කොටස් කෘෂිකාර්මික නොවන කටයුතු" යන්න	"ඉහත නියෝග 1 යටතේ වූ අක්කර 05 ට අඩු ඉඩම් කොටස් කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන කටයුතු " ලෙස
උපලේඛණ - 2 හි 14. D. හි; "ඉහත වක්‍ර ලේඛනයේ අංක 06 කාණ්ඩය " යන්න	"ඉහත වක්‍රලේඛ අංක 07 කාණ්ඩය" ලෙස
උපලේඛණ - 2 හි D. VII. හි; "අක්කර 05 ට අඩු ඉඩම් සඳහා " යන්න	"අක්කර 05 ට අඩු කෘෂි කාර්මික නොවන ඉඩම් සඳහා" ලෙස
උපලේඛණ - 2 හි E. ; "ඉහත වක්‍ර ලේඛනයේ 07 වන කාණ්ඩය අනුව " යන්න	"ඉහත වක්‍රලේඛයේ 08 වන කාණ්ඩය අනුව" ලෙස

නීතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

නීතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.